ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## <u>විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය (2024 ජූනි 20)</u>

විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2024 ජූනි 20 වන දින නිල ශ්‍රී ලංකා සංචාරයක නිරත වනු ඇත.

2. සංචාරය අතරතුරදී, එතුමා හවුල්කාරිත්වය හා සම්බන්ධ පුළුල් පරාසයක කරුණු රැසක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නායකත්වය සමඟ සාකච්ඡා පවත්වනු ඇත. මෙය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා යටතේ නව රජය පිහිටුවීමෙන් පසු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් සිදු කරන පළමු ද්විපාර්ශ්වීය සංචාරය වේ. ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය තහවුරු කරමින් මෙම සංචාරය සිය සමීපතම සමුද්‍රීය අසල්වැසියා වශයෙන් හා විශ්වාසදායි මිතුරා වශයෙන් ශ්‍රී ලංකාව වෙත ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම අවධාරණය කරයි. මෙම සංචාරය සම්බන්ධකතා ව්‍යාපෘතීන්වලට සහ ක්ෂේත්‍ර රැසක් පුරා පවතින අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සහයෝගයට ජවය එක් කරනු ඇත.

***

කොළඹ
2024 ජූනි 19

මූලාශ්‍රය:
[https://www.mea.gov.in/press-releases.htm?dtl/37883/Visit_of_External_Affairs_Minister_to_Sri_Lanka_June_20_2024](https://www.mea.gov.in/press-releases.htm?dtl/37883/Visit_of_External_Affairs_Minister_to_Sri_Lanka_June_20_2024)